# ජාතික ඖෂධ නියාමන අධිකාරිය
## තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ **සහකාර ඖෂධ පරීක්ෂක තනතුර** සඳහා **වසර 01ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත** බඳවා ගැනීමට සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

**01. සහකාර ඖෂධ පරීක්ෂක (කොන්ත්‍රාත්) : (පුරප්පාඩු ගණන 05 යි)**

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී/ විද්‍යාවේදී/ මහජන සෞඛ්‍ය/ ජීව විද්‍යාව/ භෞතික විද්‍යාව/ ආහාර විද්‍යාව /ඖෂධවේදය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

මාසික කොන්ත්‍රාත් වැටුප : MA 5-1 -2016 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.34,870/- හා අනුමත දීමනා

වයස : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක හා/ හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීමෙනි.

වෙනත් කරුණු :-

සෑම ඉල්ලුම්කරුවක් ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් යොමු කල යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.06.03 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ cv@nmra.gov.lk යන විද්‍යුත් ලිපිනයට ඊ-මේල් කිරීම මඟින් යොමු කල යුතුය. අයදුම්පත් යොමු කිරීමේදී විෂය ලෙස අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

සභාපති,
ජාතික ඖෂධ නියාමන අධිකාරිය.